

වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්

வருடாந்த செயல்திறன் அறிக்கை மற்றும் கணக்குகள்

Annual Performance Report and Accounts

2022

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சு

Ministry of Tourism and Lands



වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් - 2022

සංචාරක අංශය

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

මෙම වාර්තාව **2002** සැප්තැම්බර් **12** දිනැති අංක **402** දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ අවශ්‍යතා සපුරාලීම පිණිස සකස් කරන ලදි.

2022 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව හා ගිණුම්

ආයතනයේ නම - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය - 122

පරිච්ඡේදය		පිටු අංකය
පරිච්ඡේදය 01	**ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	01 – 04
පරිච්ඡේදය 02	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	05 – 12
පරිච්ඡේදය 03	වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය	13
පරිච්ඡේදය 04	**කාර්යසාධන දර්ශක**	14
පරිච්ඡේදය 05	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**	15
පරිච්ඡේදය 06	**මානව සම්පත් පැතිකඩ**	16
පරිච්ඡේදය 07	**අනුකූලතා වාර්තාව**	17 - 21

වගු

වගු අංකය	වගු විස්තරය	පිටු අංක
2.1	සංවර්ධන ව්‍යාපෘතිවල සඳහා වෙන්කල ප්‍රතිපාදන සාරාංශය	5
2.2	සංචාරක සංවර්ධන ව්‍යාපෘතිවල සාරාංශය	6
2.3	දැනුම වැඩි කරගැනීමට උපකාරී වන තාක්ෂණික සහය - ප්‍රදානය (*KSTA)* ව්‍යාපෘතියේ ප්‍රගතිය	8 - 9
2.4	සංචාරක ප්‍රතිවර්තන ව්‍යාපෘතියේ ප්‍රගතිය	10
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	14
4.2	ප්‍රධාන කාර්ය සාධන දර්ශක(සංචාරක අංශය)	14
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	15
6.1	කාර්ය මණ්ඩල කළමනාකරණය (2022.12.31 දිනට)	16
6.2	මානව සම්පත් සංවර්ධනය සඳහා වූ වැඩසටහන්වල ප්‍රගතිය (2022.12.31 දිනට)	16
7.1	අනුකූලතා වාර්තාව	17 - 21

පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/විධායක සාරංශය

1.1 හැඳින්වීම

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය 2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධි විධාන ප්‍රකාරව ස්ථාපිත කරන ලදී. ඉහළ විදේශ විනිමය, රැකියා සහ ජීවනෝපාය උත්පාදන අංශයක් ලෙස සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම, ශ්‍රී ලාංකීය සංස්කෘතිය, ජෛව විවිධත්වය, පරිසර හිතකාමිත්වය සහ මිත්‍රශීලී ජන අනන්‍යතාවය ඉස්මතු කරමින්, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම ආදිය සංචාරක විෂය භාරව වෙනම අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු අතර වේ.

1.2. දැක්ම, මෙහෙවර

1.2.1. දැක්ම

මතකයේ රැඳෙන , අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දූපත ලෙස හඳුනා ගැනීම.

1.2.2. මෙහෙවර

ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත්වීම.

1.3. විෂයපථය

ශ්‍රී ලාංකීය සංස්කෘතිය, ජෛව විවධත්වය, පරිසර හිතකාමීත්වය හා මිත්‍රශීලි ජන අනන්‍යතාවය මතු කරමින් ශ්‍රී ලංකාව සංචාරක ආකර්ශිත රටක් බවට පත්කරමින්, ඉහළ ආදායම් ලබන රැකියා හා ජීවනෝපාය ක්ෂේත්‍රයක් හා උසස් විදේශ විනිමයක් උපයන ආර්ථික ක්ෂේත්‍රයක් ලෙස සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම.

1.4. කාර්යයන් හා කර්තව්‍යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා සංචාරක හා ඉඩම් විෂයන්ට සහ ගැසට් පත්‍රයේ දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම හා උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම.

5. සංචාරක නියෝජිතායතන හා සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන් ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු සිදු කිරීම

6. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඩ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් ශ්‍රී ලංකාව සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම.

7. සංචාරකයින් සඳහා නිවාඩු නිකේතනයන් හා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථාන, හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

8. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

9. සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


ලේකම්
ප්‍රධාන ඉංජිනේරු විගණක
ප්‍රධාන ගිණුම් නිලධාරි
අතිරේක ලේකම් (පරිපාලන)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (සංවර්ධන)
ඉංජිනේරු සහකාර ලේකම්
සහකාර ලේකම්
02
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
ඉංජිනේරු/සහකාර අධ්‍යක්ෂ
03
ඉංජිනේරු/සහකාර අධ්‍යක්ෂ
01
ප්‍රධාන ඉංජිනේරු
ප්‍රධාන ගණකාධිකාරි
ගණකාධිකාරි
අභ්‍යන්තර විගණක
02
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි
ගිණුම් නිලධාරි
පරිපාලන
02
ගොඩනැගිලි
ගොඩනැගිලි
01
ඉංජිනේරු
ඉංජිනේරු
ඉංජිනේරු

1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

i. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ii. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

iii. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

iv. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

v. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ)	ව්‍යාපෘතියේ නම	-	සංක්‍රාන්ති නිවාස ඒකකය - මඩු , මන්නාරම
ආ)	දායක නියෝජිතායතනය	-	ඉන්දියානු රජය
ඇ)	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය	-	රු.මි 326.00 (රු.මි.300 ක් ඉන්දියානු රජය සහ රු.මි.24 ශ්‍රී ලංකා රජය)
ඈ)	ව්‍යාපෘතියේ කාල සීමාව	-	2018 - 2022

පරිච්ඡේදය 2

ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2 පරිච්ඡේදය

2.1. ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආදායම් විෂමතාව අඩු කිරීමට මෙන්ම ආර්ථික වර්ධනයට හා රැකියා නියුක්තියට විශාල වශයෙන් දායක වන ශුද්ධ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන අංශයක් වේ. කොවිඩ්-19 වසංගතයෙන් පසු රටේ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයේ අඛණ්ඩ සහ ස්ථාවර වර්ධනය 2021 වර්ෂයේ අග භාගයේ සිට 2022 වර්ෂයේ මුල් භාගය දක්වා පහත වැටුණි.

රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ හැකියාව හඳුනා ගනිමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට සුදුසු උපාය මාර්ග අනුගමනය කර ඒවා ක්‍රියාත්මක කිරීම මේ වසරේ දී ආරම්භ කරන ලදී.

සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කල ප්‍රතිපාදන සාරාංශය **වගුව :2.1**

අනුක්‍රමික අංකය	විස්තරය	වෙන් කිරීම(රු. මිලියන)	2022.12.31 දිනට වියදම (රු. මිලියන)
1	සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම	57.00	7.67
2	මන්නාරම මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය	300.00	86.7
	එකතුව	**357.00**	**94.36**

මූලාශ්‍රය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

2.2. සංචාරක ආකර්ශනීය ස්ථාන සංවර්ධනය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසාරභාවය අරමුණු කරගනිමින් සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 57 ක ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයට ලබා දෙන ලදී. ඒ යටතේ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2.2 වගුවේ දක්වා ඇති සංවර්ධන කාර්යයන් හඳුනා ගන්නා ලදී.

ව්‍යාපෘතියේ අරමුණු:

- සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනය සහතික කිරීම.
- දේශීය හා විදේශීය සංචාරකයින්ට ගුණාත්මක සේවාවක් සැපයීම.
- සංචාරකයින්ගේ පැමිණීම වැඩි කිරීම සහ සංචාරකයින්ගේ වියදම් ධාරිතාව වැඩි කිරීම සඳහා විධික්‍රම වැඩිදියුණු කිරීම.
- සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

සංචාරක සංවර්ධන ව්‍යාපෘතිවල සාරාංශය **වගුව : 2.2**

නො.	ව්‍යාපෘතියේ නම	ප්‍රතිපාදන රු.මි.	**2022.12.31** දිනට වියදම රු.මි.
2021 වසරේ නිමකරන ලද 2022 වසරේ දී ගෙවීම් සිදුකරන ලද ව්‍යාපෘති			
1	කුඩුම්බිගල සංවර්ධන කටයුතු (කුඩුම්බිගල විහාරස්ථානයේ වැසිකිළි සහ ජල ටැංකියෙහි කොන්ක්‍රීට් පුවරුව ඉදිකිරීම)	0.48	0.48
2	මන්නාකැති ඇල්ල සංවර්ධන කටයුතු (පිවිසුම් පඩි පෙළ ඉදිකිරීම, පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම, සහ නැරඹුම් ස්ථානය ඉදිකිරීම)	2.94	2.94
අවිච්ඡින්න ව්‍යාපෘති			
3	මදුනාගල සංවර්ධන කටයුතු (පවතින වැසිකිළි කාමර ප්‍රතිසංස්කරණය කිරීම, විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම)	6.35	3.75*
4	බෝපත් ඇල්ල I සහ II අදියර සංවර්ධන කටයුතු (පොදු වැසිකිළිය ඉදිකිරීම)	7.20	0.49**
5	පොරවගල සංවර්ධන කටයුතු (වැසිකිළි පද්ධතිය ඉදි කිරීම හා ආරක්ෂක තාප්පය ඉදි කිරීම	4.80	**
	එකතුව	**21.77**	**7.66**

මූලාශ්‍රය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

* වියදම අඩුකර ගනිමින් 100% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.
** ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා ඇත.

2021 වර්ෂයේ අප රට මුහුණ දුන් කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම වසරේ සිදු කිරීමට තෝරාගත් ව්‍යාපෘති 03ක් අවසන් කිරීමට නොහැකිවිය. එම අවිච්ඡින්න ව්‍යාපෘති 03 සහ නව ව්‍යාපෘති 11ක් ඇතුළුව ව්‍යාපෘති 14ක් 2022 වර්ෂයේදී සිදු කිරීමට තෝරා ගන්නා ලදී.

කෙසේ වෙතත්, රටේ පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් අනුව එම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීමට සිදු විය.

අවිච්ඡින්න ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

- **ව්‍යාපෘතියේ නම - බෝපත් ඇල්ල සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම**

ව්‍යාපෘතිය හැඳින්වීම - රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති බෝපත් ඇල්ල දෙස් විදෙස් සංචාරකයින් විශාල වශයෙන් ආකර්ෂණය කර ගන්නා ස්ථානයකි. දිනකට දෙස් විදෙස් සංචාරකයන් දහස් ගණනක් මෙම සුන්දර දියඇල්ල නැරඹීමට පැමිණෙන බැවින් සංචාරක ගමනාන්තයක් ලෙස මෙය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය 2021 සහ 2022 වසරවලදී අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර සනීපාරක්ෂක හා රථවාහන නැවැත්වීමේ පහසුකම් වැඩිදියුණු කිරීම ඒ යටතේ සිදු කෙරේ. ඒ අනුව 2021 සහ 2022 වසර සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 12.84ක් සහ රුපියල් මිලියන 4.84ක් වෙන් කරන ලදී.

භෞතික ප්‍රගතිය - 50%
මූල්‍ය ප්‍රගතිය - 48%
ව්‍යාපෘති කාලසීමාව - 2021.01.01 සිට 2022.12.31 දක්වා

- **ව්‍යාපෘතියේ නම - පොරවගල සංචාරක නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීම**

ව්‍යාපෘතිය හැඳින්වීම - බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මහඋල්පත පාරේ පොරවගල ගම්මානය පිහිටා ඇත. ඉහළ පෙව විවිධත්වයකින් යුත් පොරවගල ප්‍රදේශය ඉතා යහපත් දේශගුණයකින් හා මනරම් දර්ශනීය ස්වභාවික පරිසරයකින් සමන්විත වේ. රුපියල් මිලියන 6.40 ක් මෙම ව්‍යාපෘතියට වෙන්කර ඇති අතර ව්‍යාපෘතිය මඟින් නැරඹුම් මධ්‍යස්ථානය වටා ආරක්ෂක තාප්පය ඉදිකිරීමට සහ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී.

භෞතික ප්‍රගතිය - *25%*
මූල්‍ය ප්‍රගතිය - 25%
ව්‍යාපෘති කාලසීමාව - 2021.01.01 සිට 2021.12.31

- **ව්‍යාපෘතියේ නම - මදුනාගල උණුදිය උල්පත් ආශ්‍රිත සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම**

ව්‍යාපෘතිය හැඳින්වීම - මෙම ගම්මානය හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරිය වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. දෙස් විදෙස් සංචාරකයන්ගේ ඉහළ ආකර්ෂණයක් දිනාගත් මදුනාගල උණුදිය උල්පත් නැරඹීමට දෛනිකව සංචාරකයෝ විශාල පිරිසක් පැමිණෙති. එහි පවතින වැසිකිලි පද්ධතිය හා විවේකාගාරය රු.මි. 3.75 ක වියදමක් මත සංවර්ධනය කරන ලදි.

ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

භෞතික ප්‍රගතිය - 100%
මූල්‍ය ප්‍රගතිය - *100%*
ව්‍යාපෘති කාලසීමාව - 2021.01.01 සිට 2021.12.31

2.3 විදේශීය අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති සහ ජාත්‍යන්තර බැඳීම්

ප්‍රදාන ආකාරයෙන් ප්‍රදායකයින් විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති ප්‍රදායකයින් විසින් ම සෘජු ව ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා පමණක් මෙම අමාත්‍යාංශය පහසුකම් සපයනු ලබයි.

- **ව්‍යාපෘතියේ නම - දැනුම වැඩි කරගැනීමට උපකාරී වන තාක්ෂණික සහය - ප්‍රදානය (*KSTA)***

අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය : ආසියානු සංවර්ධන බැංකුව(ADB*)*
ව්‍යාපෘති කාලසීමාව : 2019 දෙසැම්බර් 24 - 2024 දෙසැම්බර් 31
ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ඇමෙරිකානු ඩොලර් 1,500,000.00

ව්‍යාපෘතියේ අරමුණ - මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ 2019 පාස්කු ප්‍රහාරයෙන් සහ කොවිඩ් වසංගතයෙන් පසු වහා ප්‍රකෘතිමත් වන සහ තරගකාරී සංචාරක ක්ෂේත්‍රයක් ගොඩනැගීමට ශ්‍රී ලංකා රජය දරන උත්සාහයට සහාය වීමයි. ව්‍යාපෘතිය මුලින් සැලසුම් කර තිබුණේ වසර දෙකක කාලයක් සඳහා වන නමුත් බාහිර බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ මන්දගාමී ක්‍රියාකාරිත්වය හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් අතිරේක ප්‍රතිපාදන වශයෙන් ඩොලර් 1,000,000 ක් ද සමඟ මුල් ව්‍යාපෘති කාලසීමාව 2024 දෙසැම්බර් දක්වා දීර්ඝ කර ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

ව්‍යාපෘතියේ ප්‍රගතිය **වගුව: 2.3**

	නිමැවුම	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය %
01	සත්කාරක නිවාස මෙහෙයවන්නන් සේවා ගුණාත්මක භාවය පිළිබඳ ව පුහුණු කරන ලද අතර ඔවුන්ගේ අලෙවිකරණ කුසලතා වැඩි දියුණු කරන ලදී.	පුහුණුකරුවන් 6 දෙනෙකු සහ සත්කාරක නිවාස මෙහෙයවන්නන් 25 දෙනෙකු පුහුණු කරන ලදී.	23%
02	කාන්තාවන් සහ තරුණයින් අතර සංචාරක ව්‍යාපාරය පිළිබඳ දැනුවත් භාවය සහ අවබෝධය	උසස් පෙළ සිසුන් 33 දෙනෙකු දැනුවත් කිරීමේ පළමු වැඩසටහන මහනුවරදී පැවැත්විණි.	5.95%
03	ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් විෂයමාලා යාවත්කාලීන කරන ලදි.	උපාධි පාඨමාලාවට උසස් කිරීම සඳහා විෂයමාලාව සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. ආයතනික විගණනය සහ තත්ව සහතිකකිරීමේ යන්ත්‍රණය හා ක්‍රියා පටිපාටි පිළිබඳ ව SLITHM HOD හි වැඩමුළු දෙකක් සඳහා පහසුකම් සපයන ලද අතර ආදර්ශ විගණනයක් පවත්වන ලදී.	85%
04	සංචාරක යෙදවුම්වල අන්තර්ගතය සංවර්ධනය කරන ලදී.	ජංගම සංචාරක යෙදවුම සඳහා අන්තර්ගත සංවර්ධනය සඳහා සමාගමකට (WADI) කොන්ත්‍රාත්තුවක් ලබා දෙන ලදී. සමාගම විසින් අන්තර්ගත සැලැස්ම SLTPB හි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	58%
05	පිරිනමනු ලබන සංචාරක නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සඳහා ආධාර සපයන ලදී.	සංචාරක නිෂ්පාදන හඳුණාගැනීම ගැනීම සඳහා ඇගයීමක් සිදු කරන ලදී(ඩිජිටල් සංචාරකයින්). නව නිෂ්පාදන පිරිනැමීම් සඳහා පද්ධති හා ක්‍රියාවලි සංවර්ධනය කිරීම සඳහා උපදේශකයින් සම්බන්ධ කර ගෙන ඇත. SLTDA සඳහා පුහුණු සහ අලෙවි සැලැස්මක් ඉදිරිපත් කර ඇත. නව නිෂ්පාදන පිරිනැමීම් ක්‍රියාත්මක කරමින් SLTDA කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. සමුද්‍රීය සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කිරීමට සමුද්‍රීය සංචාරක උපදේශකයෙකු සඳහා සමුද්දේශ විෂය (TOR) අවසන් කරන ලදී.	82%

06	සංචාරක ව්‍යාපාරය ප්‍රකෘතිමත් කිරීම සඳහා නව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.	PWC ඔවුන්ගේ ආරම්භක හා උපාය මාර්ගික වාර්තාව ඉදිරිපත් කර ඇත. උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම හෝ වෙනත් රාජ්‍ය ප්‍රතිපත්ති ලේඛනයක් යටතේ සහායක ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා පාර්ශව කරුවන්ට උපදේශන පවත්වන ලදී. ක්ෂුද්‍ර ජාල ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා පරීක්ෂා කිරීම සඳහා මීගමුව සහ පාසිකුඩා ප්‍රදේශවල සිදු කරන ලද මූලික ක්ෂේත්‍ර අධ්‍යයනයන්	24%

මූලාශ්‍රය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව

- **ව්‍යාපෘතියේ නම : ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල වඩාත් අවදානමට ලක් විය හැකි දිස්ත්‍රික්කවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා සහාය වීම - ප්‍රදානය (තාක්ෂණික සහය*)***

අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය	:	යුරෝපා සංගමය
ව්‍යාපෘති කාලසීමාව	:	2022 ජූනි 15 - 202*4* ජූනි 15
ව්‍යාපෘතියේ මුළු මුදල	:	යුරෝ 700,000

ව්‍යාපෘතියේ අරමුණ - මධ්‍යම පළාතේ සහ ඌව පළාතේ ප්‍රජාවන්ගේ ජීවනෝපාය සහ යහපැවැත්ම සඳහා සහාය වීම පිණිස තිරසාර සහ සංගෘහීත පරිසර හිතකාමී සංචාරක ආකෘතියක් සංවර්ධනය කිරීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, යුරෝපා සංගමය

ප්‍රගතිය - තාක්ෂණික සහය යටතේ සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

- **ව්‍යාපෘතියේ නම: ඉන්දු - පැසිෆික් ඉඩ ප්‍රස්ථා ව්‍යාපෘතිය (*IPOP)***

ආධාර දෙනු ලබන නියෝජිතායතනය	:	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID*)*
ව්‍යාපෘති වර්ගය	:	ප්‍රදාන *(තාක්ෂණික සහය)*
ව්‍යාපෘති කාලසීමාව	:	2022 ජූලි 15 - 2024 මාර්තු 31
ව්‍යාපෘතියේ මුල් මුදල	:	ඇමෙරිකානු ඩොලර් මිලියන 3.206

ව්‍යාපෘතියේ අරමුණ - සංචාරක කර්මාන්තයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උදෙසා වර්ධනය වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා තිරසාර ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සඳහා "ඉඩම් බැංකුවක්" ඇති කිරීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිතායතනය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

ප්‍රගතිය - පුද්ගලික අංශය සමඟ එක්ව ක්‍රියා කිරීම ආරම්භ කළ අතර කාර්තුවේ මුල් භාගයේ දී සැලකිය යුතු මූලික පර්යේෂණ සිදු කරන ලදී. ජූලි මාසයේ දී ඒකාබද්ධ කිරීමේ ලිපිය ලැබීමෙන් පසු, රජයේ ආයතන සමඟ සම්බන්ධතා ආරම්භ කරන ලදී.

- **ව්‍යාපෘතියේ නම - සංචාරක ප්‍රතිවර්තන ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ Pekoe Trail**

අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය : යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය

ව්‍යාපෘතියේ මුල් මුදල : යුරෝ මිලියන 2.5, *ඇ.ඩො.මි 100000*

ව්‍යාපෘතියේ අරමුණ - සංචාරක සේවා හෝ නිෂ්පාදනවල පවතිනා හිඩැස් පිරවීම සඳහා මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සහභාගීත්වය සහතික කරමින් ව්‍යාපාර ආරම්භ කිරීම දිරිමත් කිරීම සඳහා සුළු ආධාර වැඩසටහනකට සම්බන්ධ කරන ලද "සුවිශේෂී සංචාරක අත්දැකීමක්" ලෙස මධ්‍යම සහ ඌව පළාත්වල ඇවිදින මං පෙත් ජාලයක් සංවර්ධනය කිරීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිතායතනය-සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, යුරෝපා සංගමය

ව්‍යාපෘතියේ ප්‍රගතිය **වගුව : 2.4**

	ව්‍යාපෘතියේ නිමැවුම	ව්‍යාපෘති ක්‍රියාකාරකම්	ප්‍රගතිය
1	සුවිශේෂී සංචාරක අත්දැකීම් සංවර්ධනය කිරීම	• කිලෝමීටර් *300* ක සංචාරක ඇවිදින මං පෙත් සිතියම් කරණ ක්‍රියාවලිය • ස්වාභාවික මං පෙත් පිළිබඳ ගැසට් නිවේදනය කෙටුම්පත් කෙරෙමින් පවතී. • ප්‍රජාව දැනුවත් කිරීම සහ පාර්ශව කරුවන් සම්බන්ධ කර ගැනීම	ක්‍රියාත්මක කෙරෙමින් පවතී

මූලාශ්‍රය - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

- **ව්‍යාපෘතියේ නම - මන්නාරම, මඩු දේවස්ථාන පරිශ්‍රයෙහි සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ප්‍රදානය (තාක්ෂණික සහය*)***

අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය : ඉන්දීය රජය
ව්‍යාපෘති කාලසීමාව : *2018* - 2022
ව්‍යාපෘතියේ මුල් මුදල : රුපියල් මිලියන *300*

ව්‍යාපෘතියේ අරමුණ - වන්දනා කටයුතු සඳහා මඩු දේවස්ථානයට පැමිණෙන බැතිමතුන්ට නවාතැන් පහසුකම් සැපයීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිතායතනය - ඉන්දීය රජය

ව්‍යාපෘතියේ ප්‍රගතිය - මඩු දේවස්ථාන පරිශ්‍රයෙහි සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ආර්. ඒ. ඉදිකිරීම් සමාගමට ප්‍රදානය කරන ලදී. මූලික ඉදිකිරීම් ආරම්භ කරන ලද නමුත් බාහිර අභියෝග හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල ඉතා මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කළ අතර ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් අනපේක්ෂිත ලෙස ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරු මිල වැඩි කරන ලෙස ඉල්ලමින් ඉදිකිරීම් තාවකාලිකව නතර කර ඇත. මිල ඉහළ යාම හේතුවෙන් නව ප්‍රතිපාදන වෙන් කරන ලෙස ඉල්ලීම දැනටමත් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට යොමු කර ඇත.

භෞතික ප්‍රගතිය : ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය *16%* පමණ වේ.

මූල්‍ය ප්‍රගතිය : මිලියන *69.1* බලමුළු ගැන්වීමේ අත්තිකාරම් මුදල ඇතුළුව මුළු මුදල රුපියල් මිලියන *86.7* කි. රුපියල් මිලියන *17.6* ක පළමු ගෙවීම කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත.

- **ඕමාන් සුල්තාන් රාජ්‍යය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව**

ඕමාන් සුල්තාන් රාජ්‍යයේ උරුම සහ සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය අතර සංචාරක ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගිතාව ඉහළ නැංවීම සඳහා රටවල් දෙක අතර අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කිරීමට අපේක්ෂා කෙරේ.

දෙපාර්ශවයේ ම දැනුවත් භාවයෙන් මෙම අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කිරීම අවසන් කර ඇති අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය, නීතිපතිවරයා සහ විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළු අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇත.

ඒ අනුව යථා කාලයේ දී අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙපාර්ශවය විසින් එකඟ වන සුදුසු දිනයක් තීරණය කිරීමට නියමිත ය.

- **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ කාම්බෝජ රාජධානියේ රජය අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MoU)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ කාම්බෝජ රාජධානියේ රජය අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම 2022 මැයි මස 10 දින අත්සන් කරන ලදී.

2.4 තාක්ෂණ, යටිතල පහසුකම්, ක්‍රියාවලි සහ නිපුණතා (TIPS) වැඩසටහන

සංචාරක ක්ෂේත්‍රයේ වත්මන් ගැටළු සහ බාධාකාරී හිඩැස් තක්සේරු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සහ මග පෙන්වීම යටතේ, අමාත්‍යාංශයේ නිලධාරීන්, සංචාරක ආයතන සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍රවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව තෙදින වැඩමුළුවක් පවත්වන ලදී. ඒ අනුව, සංචාරක කර්මාන්තයේ වත්මන් ගෝලීය සංවර්ධන ප්‍රවණතා සමඟ සමපාත වීම සඳහා *"TIPS" (*Technology, Infrastructure, Process, Skills) ලෙස හඳුනා ගත් ගැටළු යොදා ගන්නා ලදී.

තාක්ෂණය (Technology) - සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගෝලීය ප්‍රවණතා අනුව තාක්ෂණික අංශයේ සංවර්ධන ප්‍රමුඛතා හා නව තාක්ෂණික යෙදවුම් භාවිතා කරන බව හඳුනා ගන්නා ලදී.

යටිතල පහසුකම් (Infrastructure) - අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නව සංචාරක ගමනාන්ත සහ පවතින ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීමේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දෙන බව හඳුනා ගන්නා ලදී.

ක්‍රියාවලිය (Process) - සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා නව ක්‍රියාකාරකම් සහ පවතින ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සහ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

නිපුණතා (Skills) - සංචාරක කර්මාන්තයේ නියැලී සිටින මානව සම්පත්වල නිපුණතා වැඩිදියුණු කිරීම සහ එම අවශ්‍යතා සපුරාලීම පිණිස නිපුණතා ලබා ගැනීමට තරුණ තරුණියක් පුහුණු කිරීම අවශ්‍ය බව හඳුනා ගන්නා ලදී.

2.5 ජාතික සංචාරක ප්‍රතිපත්තිය සකස් කිරීම

රේඛීය අමාත්‍යාංශයක් වශයෙන් සංචාරක අමාත්‍යාංශය 2021 වර්ෂය ආරම්භයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික සහය ලබා ගනිමින් ජාතික සංචාරක ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගෙන ඇත. සංචාරක ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සෘජුවම දායක වන තිරසාර සංචාරක කර්මාන්තයක් නිර්මාණය කිරීමේ දී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විධි විධාන හා මඟ පෙන්වීම ලබා දෙනු ඇත.

සංචාරක කර්මාන්තයේ වත්මන් තත්ත්වය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එම කර්මාන්තය විවිධ අභියෝගවලට මුහුණ පාන බව හඳුනා ගෙන ඇත. මූලික ගැටළු සහ දුර්වලතා හඳුනා ගෙන ඇති අතර මෙම ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ එම ගැටලුවලට පිළියම් යෙදීම, සංචාරක කර්මාන්තයේ අනාගත දිශානතිය සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම, ඵලදායී තිරසාර සංචාරක සංවර්ධනය සඳහා අවශ්‍ය පෙලඹීම සහ තිරසාර, පරිවර්තනීය සහ සංගෘහිත ආර්ථිකයක ආයෝජන අවස්ථා පුළුල් කිරීම ය.

ඒ අනුව ජාතික සංචාරක ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ජාතික සංචාරක ප්‍රතිපත්ති ක්‍රියාවලියේ මීළඟ අදියර සම්පූර්ණ කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම සහ ජාතික සංචාරක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අධීක්ෂණ සහ ඇගයීම් සැලැස්ම ඉතා වැදගත් වේ.

පරිච්ඡේදය 3

වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3 පරිච්ඡේදය සමස්ථ මූල්‍ය කාර්ය සාධනයෙහි ඇතුලත් කර ඇත.

පරිච්ඡේදය 4

කාර්යසාධක දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) වගුව: **4.1**

විශේෂිතදර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
සංචාරක පහසුකම් සංවර්ධනය		√	
සත්කාරක ක්ෂේත්‍රයේ පුහුණු කරන ලද තරුණ තරුණියන් ප්‍රමාණය			√
සංවර්ධනය කරන ලද ප්‍රජා සත්කාරක නිවාස ප්‍රමාණය			√
සංවර්ධනය කරන ලද සංචාරක උරුමයන් ප්‍රමාණය			√

මූලාශ්‍රය : සංචාරක අමාත්‍යාංශය

4.2. ප්‍රධානකාර්යසාධනදර්ශක(සංචාරකඅංශය) වගුව: **4.2**

අරමුණ		ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI)	වර්ෂය				
			2018*	**2019***	**2020***	**2021***	**2022**
1	ශ්‍රී ලංකාව කලාපයේ හොඳම සංචාරක ගමනාන්තය බවට පත් කිරීම.	සංචාරක පැමිණීම් මිලියන 2.2 සිට මිලියන 4.0 දක්වා වැඩිකිරීම.	2.33	1.91	0.5	0.19	0.71
2	ජාතික ආර්ථිකයට දායකවීම.	සංචාරක ආදායම් ඇ.ඩො.බිලියන 3 සිට බිලියන 7 දක්වා වැඩිකිරීම.	4.4*	3.6	0.6*	0.5*	1.1*
3	සංචාරක සම්පත් විශිෂ්ට ලෙස භාවිතකිරීම සඳහා ඵලදායී හා ප්‍රතිඵල මත පදනම්වූ සංචාරක කර්මාන්තයක් නිර්මාණය කිරීම.	සංචාරක කර්මාන්තය ආශ්‍රිත විදේශ ආයෝජන ඇ.ඩො.බිලියන 03 දක්වා වැඩිකිරීම.	2,955**	3,781**	879.94 USD	133.73	2022 වසරේ ලැබුණු ව්‍යාපෘති - 42 කාමර සංඛ්‍යාව – 1054 ආයෝජන US$ මී. – 68.437
4	කර්මාන්තයේ වෘත්තීයතාවය ඉහළ නැංවීම.	සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 600,000ක් උත්පාදනය කිරීම.	381,178*	402,607	347,757*	357”927*	-
5	ඉහළ අගයක් ඇති සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා පරිසරයක් නිර්මාණය කිරීම.	රට තුළ සංචාරකයින් රැඳී සිටීම දින 07 සිට 12 දක්වා වැඩි කිරීම.	10.8*	10.4	8.5	15.1	9.34

මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය

පරිච්ඡේදය 5

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු **වගුව : 5.1**

අරමුණ/ඉලක්කය/දර්ශකය	පාදම් වර්ෂය / ඒකක	ඉලක්කය					
		2021	2022	2023	2024	2025	2030
අරමුණ8. අඛණ්ඩ, සංගෘහිත සහ තිරසර ආර්ථික වර්ධනයක්, පූර්ණ හා ඵලදායී සේවා නියුක්තියක් සහ සැමට යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම							
ඉලක්ක අංක 8.9 **2030 වන විට, රැකියා බිහිකරන, දේශීය සංස්කෘතිය සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කරන තිරසර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**							
8.9.1 මුළු දළ දේශීය නිෂ්පාදිතයේ සහ වර්ධන වේගයේ ප්‍රමාණයක් ලෙස සංචාරක අංශයේ දළ දේශීය නිෂ්පාදිතය.	**2018 ඇ.ඩො.මී 4,381**	5,040	5,260	5,480	5,700	5,920	7,020
8.9.2 (අ) සංචාරක අංශයේ මුළු සෘජු රැකියාවලින් තිරසර සංචාරක කර්මාන්තවලරැකියා ප්‍රමාණය.	**2018 / සංඛ්‍යාව 169,003**	194,353	202,803	211,253	219,703	228,153	270,403
8.9.2 (ආ)සංචාරකඅංශයේමුළුවක්‍ර රැකියාවලින් තිරසර සංචාරක කර්මාන්තවල රැකියා ප්‍රමාණය.	**2018 / සංඛ්‍යාව 219,484**	252,407	285,329	318,252	351175	384097	436,968
අරමුණ 12. තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම							
ඉලක්ක අංක 12.ආ **රැකියා උත්පාදනය කරන සහ දේශීය සංස්කෘතිය සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කරන තිරසර සංචාරක කර්මාන්තයට තිරසර සංවර්ධනය මඟින් සිදු කරන්නා වූ බලපෑම් අධීක්ෂණය කිරීම සඳහා මෙවලම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම**							
12.ආ.1 තිරසර සංචාරක උපාය මාර්ග හෝ ප්‍රතිපත්ති සංඛ්‍යාව සහ එකඟ වූ අධීක්ෂණ සහ ඇගයුම් මෙවලම් සමඟ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරී සැලසුම් සංඛ්‍යාව	නැත	2022 ජාතික සංචාරක ප්‍රතිපත්තිය සකස් කරමින් පවතින අතර2022 ජුනි මාසයේදී අවසන් කිරීමට නියමිතය					
අරමුණ 14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම							
ඉලක්ක අංක 14.7 **2030 වන විට, ධීවර සම්පත්, ජලජීවී වගාව සහ සංචාරක කර්මාන්තය තිරසර ලෙස කළමනාකරණය කිරීම ඇතුළුව සමුද්‍රීය සම්පත් තිරසර අන්දමින් භාවිතා කිරීම මඟින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ට සහ ඌණ සංවර්ධිත රටවලට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වැඩි කිරීම**							
14.7.1සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්හි,ඌණ සංවර්ධිත සහ සියලු රටවල්වල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමාණයක් ලෙස තිරසර ධීවර කර්මාන්තය.	දත්ත නොමැත	පාදම් දත්ත නොමැත. අමාත්‍යාංශය සුදුසු ඉලක්ක සපයා ගැනීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කරමින් සිටී.					

පරිච්ඡේදය 6

මානව සම්පත් පැතිකඩ

6. 1. කාර්ය මණ්ඩල කළමනාකරණය (2022.12.31 දිනට) වගුව : 6.1

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	21	15	06
තෘතීයික	05	03	02
ද්විතීයක	68	68	0
ප්‍රාථමික	22	14	08
එකතුව	**116**	**100**	**16**

6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ කාර්ය සාධනයට බලපා ඇති ආකාරය කෙටියෙන් දක්වන්න

අමාත්‍යාංශයට පැවරී ඇති රාජකාරි මනාව ඉටු කිරීම සඳහා, සේවක සංඛ්‍යාවේ දැනට පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම වැදගත් වේ.

6.3. මානව සම්පත් සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය

නිලධාරීන්ට ලබා දෙන ලද පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු වගුව: 6.2

සහභාගි වූ නිලධාරීන්	පුහුණු වැඩසටහන
කාර්යාල කාර්ය සහායක	පෙරටු කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සම්මන්ත්‍රණය
සංවර්ධන නිලධාරීන් (දිස්ත්‍රික්)	තිරසාර සංචාරක සංවර්ධනය පිළිබඳ තෙදින නේවාසික පුහුණු වැඩසටහන

පරිච්ඡේදය 7

අනුකූලතා වාර්තාව

07 අනුකූලතා වාර්තාව

වගුව -7.1

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත්යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය දැනුවත් කිරීම	අනුකූල වේ.		

3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අනුමත වෙන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	-		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA /1-2019 වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	මසක් ඇතුලත සියළුම අභ්‍යන්තර විගනණ වාර්තා සඳහා උත්තර ලබා දීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමණාකාර කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමණාකාර කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමණාකරනය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේෂ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	-		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	එවැනි වාහන නොමැත		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේකය 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරවවාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	සංචිත වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කරන ලදි.වෙන්කරන ලද වාහනවල ඉන්ධන දහනය වීම පරීක්ෂාකිරීමට නියමිතයි.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ශේෂ මාසයක කාලයක් තුල නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමා ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරවසලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ	අනුකූල වේ.		

	අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.			
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ප්‍රේරණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමය එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්ථා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තුලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතන පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී **ප්‍රඥප්තියක්** සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභි**ප්‍රඥප්තියක්**සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලනචක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම්කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජික යෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	පුහුණු ලබාදීමට සැලසුම් කර ඇත. (අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය අනුව තීරණය කෙරේ)		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාදන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කරිම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		



කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT
2022

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சு
Ministry of Tourism & Lands

ඉඩම් අංශය
காணிப் பிரிவு
Land Section

"මිහිකත මැදුර"
ඉඩම් මහ ලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

"மிஹிகத்த மெதுர,"
காணிச் செயலகம்
1200/6, இரஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"Mihikatha Medura"
Land Secretariat Office
1200/6, Rajamalwatta Rd,
Battaramulla.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් අංශය

කාර්ය සාධන වාර්තාව

2022

පටුන

පිටුව

01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය 01 -04

1.1 හැදින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 04 -11

03. වසරේ සමස්ත මුල්‍ය කාර්ය සාධනය 12 -16

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04. කාර්ය සාධන දර්ශක 16

05. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 16 -18

06. මානව සම්පත් පැතිකඩ 19 - 21

07. අනුකූලතා වාර්තාව 22 - 28

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - ඉඩම් අංශය

වැය ශීර්ෂ අංකය - 122

01. පරිච්ඡේදය - ආයතන පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1927 රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් ඉඩම් හා කෘෂිකර්ම විෂය සම්බන්ධයෙන් පත් කළ කමිටුවේ නිර්දේශ පරිදි 1932 වසරේ දී රජයේ ඉඩම් ප්‍රශස්ත අයුරින් කළමනාකරණය කිරීමේ අරමුණින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය පිහිටුවා ඇත. වර්ෂ 1800 අගෝස්තු මස 02 දින පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ පැරණිතම දෙපාර්තමේන්තුව වන මිනින්දෝරු දෙපාර්තමේන්තුව ද, 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනතින් ස්ථාපිත ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ද, ශ්‍රී ලංකාව තුළ පිහිටි ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු විධිමත් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අරමුණින් 1903 වර්ෂයේ දී පිහිටුවන ලද ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ද, 1972 අංක 01 දරණ පනත යටතේ පිහිටුවා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව ද, 1983 වර්ෂයේ දී ඉඩම් හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ද වශයෙන් ආරම්භ කර, 2010 ජනවාරි මස සිට දෙපාර්තමේන්තුවක් ලෙස උසස් කළ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවද, ඉඩම් අමාත්‍යාංශය යටතට පත්කර ඇත. මෙයට අමතරව මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ දෙපාර්තමේන්තුවට ආවේනික කටයුතු සඳහා නිලධාරීන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය හා 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන අනුව මිනින්දෝරු සේවාවේ වෘත්තීය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙන යාමේ අරමුණින් පිහිටුවාගෙන ඇති ඉඩම් මැනුම් සභාව ද ඉඩම් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති අතර ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඇතිවන ගැටළු විසඳා ගැනීමේ අරමුණින් 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත මඟින් ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය ද පිහිටුවා ඇත .

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රශස්තව උපයෝජිත භූමි සම්පතක්

මෙහෙවර

සැමට විධිමත් නිරවුල් හිමිකමක් හා ප්‍රශස්ත උපයෝජනයක් අත්කර දෙමින් සියලු පාර්ශවකරුවන් වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය මඟින් භූමි සම්පත කාර්යක්ෂමව කළමනාකරණයෙන් තිරසාර සංවර්ධනයට දායක වීම.

අරමුණු

- ජාතික ඉඩම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මතු පරපුර වෙනුවෙන් භෞමික පරිසරය සුරැකීම.
- රජයේ ඉඩම්වල ආරක්ෂාව සහතික කිරීම.
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඉඩම් ප්‍රශස්ත භාවිතය හා හායනයට පත්වීම වැළැක්වීමට ක්‍රියා කිරීම.
- රජයේ ඉඩම් මනාව කළමනාකරණය කිරීම හා සුදුසු ඉඩම්, ඉඩම් අහිමි ජනතාව අතර බෙදාදීම සහ සංවර්ධනය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ඉඩම් ලබා දීම.
- රටේ සියළු ඉඩම්වල හිමිකම තහවුරු කර අයිතිය ලියාපදිංචි කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ඉඩම් විෂයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- රජයේ ඉඩම් පරිපාලනය, කළමනාකරණය හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය.
- ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු.
- රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදා දීම.
- ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම.

1.4. ඉඩම් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංවිධාන සටහන



1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය
- ඉඩම් මැනුම් සභාව
- ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

02. <u>පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම</u>

2.1. <u>ප්‍රගතිය - ප්‍රතිපත්ති අංශය</u>

2.1.1. <u>පනත් සංශෝධනය</u>

සංශෝධනය කරමින් පවතින පනත්	ප්‍රගතිය
1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපනත	නේවාසික කටයුතු සඳහා ඉදිරියේදී ලබා දෙන සියලු බලපත්‍ර සඳහා එම කොන්දේසි රහිත පූර්ණ අයිතිය ඇති දීමනා පත්‍රයන් නිකුත් කිරීම සහ මෙම පනත යටතේ මෙතෙක් නේවාසික කටයුතු සඳහා නිකුත් කර ඇති සියලු දීමනා පත්‍රවල සඳහන් කොන්දේසි මෙම පනත සංශෝධිත දිනයේ සිට බල රහිත කර පූර්ණ අයිතිය ඇති දීමනා පත්‍ර සේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක 5/6/1/1CM/22/19 හා 2022.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප/22/1768/615/018 හා 2022.11.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරමින් පවතී.
1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත	අධිකරණ අමාත්‍යාංශයෙන් නැවත විමසීම.
1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත	නීති කෙටුම්පත් සම්පාදක වෙතින් සංශෝධිත පනත් කෙටුම්පත ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මේ වන විට ඉඩම් අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය සකස් කරමින් පවතී.
1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත	වාරිමාර්ග රක්ෂිත සීමා සංශෝධනය රජයේ ඉඩම් ආඥා පනත යටතේ නීතියක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශ කිරීම සඳහා උපකාරක නීති කෙටුම්පතක් ප්‍රතිශෝධනය සඳහා අවශ්‍ය වන්නා වූ නියමයන්ට අනුව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලෙසට දන්වා ඇති අතර ඒ අනුව යොමු කිරීමට කටයුතු කරමින් පවතී.
2002 අංක 17 දරණ මිනින්දෝරු පනත	මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් සහ මැනුම් සභාවෙන් යෝජනා කැඳවීම.

2.1.2. <u>ඉඩම් අත්පත් අංශය</u>

2022.01.01 දින සිට **2022.12.31** දින දක්වා ඉඩම් අත්කර ගැනීම පිළිබඳ භෞතික ප්‍රගතිය					
අනු අංකය	ක්ෂේත්‍රය අනුව ඉඩම් අත්කර ගැනීම	අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය	අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)	භුක්තිය භාරගත් ඉඩම් ප්‍රමාණය (කැබලි සංඛ්‍යාව)	භුක්තිය භාරගත් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
01	මහාමාර්ග	47	33.53889	2897	84.0453
02	වාරිමාර්ග	14	59.6494	2774	1889.3467
03	පානීය ජලය	53	11.3294	42	4.5055
04	නාගරික සංවර්ධන	09	2.1246	106	30.67208
05	ආරක්ෂක කටයුතු	07	72.3189	20	36.8027
06	ගම් පුළුල් කිරීම	07	26.1358	124	77.5483
07	අනෙකුත් පොදු කටයුතු	188	1344.7524	568	71.43285
එකතුව		325	1549.84939	6531	2194.3534

2.1.3. <u>ඉඩම් අංශය</u>

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ප්‍රගතිය

අනු අංකය	ක්‍රියාකාරකම	සංඛ්‍යාව
1.	**ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම**	
1.1	බදු හා දීමනාපත්‍ර නිර්දේශ ගොණු (රජයේ ඉඩම් ආඥා පනත යටතේ)	**3557**
1.2	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත බැඳීම්	**10**
2.	**අතිගරු ජනාධිපතිතුමාගේ අත්සන සඳහා යොමු කිරීම (රජයේ ඉඩම් ආඥා පනත යටතේ)**	
2.1	බදුකර හා දීමනාපත්‍ර (277+979)	**1256**
2.2	පූජාභූමි දීමනාපත්‍ර	**35**
2.3	සුනාමි දීමනාපත්‍ර	**473**
2.4	ව්‍යස්ථාපිත ආයතන සඳහා පැවරීම් අනුමැතිය ලබාගැනීම	**212**
3.	**ඉඩම් ගැටලු අදාළ ආයතන වෙත යොමු කිරීම**	
3.1	ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටළු අදාළ ආයතන වෙත යොමු කිරීම	**1933**
3.2	අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටළු අදාළ ආයතන වෙත යොමු කිරීම	**112**
